**ශීර්ෂය - 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව - 2024**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 23 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අන්තර් පළාත් කාර්යාල 08 හි 2024 දෙසැම්බර් 31 දින වන විට හිඟ ඉඩම් බදු ආදායම රු.මිලියන 386.73 ක් වූ අතර ඒ තුළ වර්ෂ 03 කට වඩා වැඩි හිඟ බදු කුලිය රු.මිලියන 237.08 ක් හෙවත් සියයට 61 ක් වී තිබුණි.එසේම සමාලෝචිත වර්ෂය වන විට හිඟ බදු වටිනාකමින් වර්ෂය තුළදී අයකර ගෙන තිබුණු වටිනාකම රු.මිලියන 14.88 ක් හෙවත් සියයට 3.8 ක් වැනි ඉතා පහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. | ඇස්තමේන්තු ගත නොවූ හිඟ බදු ඇතුලත්වීම නිසා බදු අයකිරීමේ ප්‍රතිශතය අඩු වී ඇත. | අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සකස් කර හිඟබදු අයකර ගත යුතුය. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 දිනට හිඟ ඉඩම් බදු කුලී ආදායමින් පොළොන්නරුව සහ අම්පාර කාර්යාල වෙනුවෙන් පමණක් පිළිවෙලින් රු.මිලියන 113.59 ක් හා රු.මිලියන 193.56 ක් ලෙස එකතුව රු.මිලියන 307.15 ක් හෙවත් සියයට 79 ක් විය.නියැදි විගණනය අනුව පොලොන්නරුවෙහි බදු දී ඇති ඉඩම් බදුකරුවන් සංඛ්‍යාව 445 ක් වූ අතර එයින් රු.මිලියන 0.4 කට වඩා හිඟ බදුකරුවන් 77 ක් වූවත් මෙම බදුකරුවන් සම්බන්ධයෙන් හිඟ බදු අයකර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ බදු අයකර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම වෙනුවෙන් අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම පළාත්/අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන් නිරන්තර දැනුවත් කරන අතර විගණන වාර්තා මගින් ද පෙන්වා දී ඇති හෙයින් එය වේගවත් කළ යුතු බවට ඔවුන් දැනුවත් කරනු ලබයි. එසේම බදු ගෙවීම් පැහැර හරින්නන් වෙත නිත්‍යානුකූලව කටයුතු කිරීමට අදාළව කටයුතු කරන ලෙසත්, නඩු පැවරීම් සඳහා ලේඛන ඉදිරිපත් කරන ලෙසත් නිරන්තර දැනුවත් කිරීම් කරනු ලැබේ. | අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සකස් කර හිඟ බදු ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බදුකරුවන් නියමිත දිනට බදු නොගෙවීම,බද්ද ක්‍රියාත්මක වන නීත්‍යානුකූල දිනය භුක්තිය භාරදුන් පසුව සිදුවීම,බදු ගිවිසුම් ඇතිකර ගැනීම සඳහා වසර ගණනාවක් ගතවීම වැනි කරුණු හිඟ බදු වටිනාකම රු.මිලියන 386.73 ක් දක්වා වැඩිවීමට හේතු වුවද බදු පැහැර හරින අය සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමක් සිදුවීම ඉතා මන්දගාමීව පැවතිණි.දෙපාර්තමේන්තුව මගින් 2020.05.20 දින නිකුත් කරන ලද අංක 2020/06 දරන චක්‍රලේඛය මගින් හිඟ බදු අයකිරීම ප්‍රවර්ධනය උදෙසා දඩ පොලිය සඳහා සහන ලබා දීමට උපදෙස් දී ඇතත්, බදු සංශෝධනය කිරීමෙන් අනතුරුව බදු ආදායම වැඩි වූ ආකාරය පිළිබද විස්තර විගණනය වෙත ඉදිරිපත් නොවිය. | සියළුම අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,සහකාර ඉඩම් කොමසාරිස් වරුන් 2024.05.31 හා 2024.10.25 යන දිනයන් හි ප්‍රධාන කාර්යාල වෙත කැදවා සහ Zoom Meeting මගින් හිඟබදු අයකිරීම විධිමත් කිරීම සම්බන්ධව දැනුවත් කිරීම් සිදු කර ඇති අතර, බදු ගෙවීම පැහැර හරින්නන් හට නෛතික ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව දැනුවත් කිරීම් සිදු කර ඇත. | අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් සකස් කර හිඟ බදු ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නිල නිවාස පවත්වාගෙන යාම හා ඒවායේ කුලී ගාස්තු අයවීම් සම්බන්ධ ලේඛන විධිමත් පරිදි පවත්වා නොතිබුණි. 2021 ජනවාරි 01 දින නිල නිවාසය භාරගත් ඉඩම් කොමසාරිස්වරයා (හිටපු) 2022 මාර්තු 31 දින දක්වා වූ රු.188,700 ක කුලී ගාස්තුව ගෙවීම් කර නොතිබුණි. | නිල නිවසයේ පදිංචිව සිටි කාලසීමාවට අදාළව නිල නිවාස කුලිය ලෙස රු.188,700 ක ද මුදලක් ගෙවීම් කරන ලෙස නිලධාරියා දැනුවත් කරන ලදී. එයින්ද රු. 25,000 ක මුදලක් මේ වන විට ගෙවා ඇත. | නිල නිවාස තොරතුරු යාවත්කාලීන කර හිඟ කුලී අය කර ගත යුතුය. |
| (ඉ) | වර්ෂ කිහිපයක සිට ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් සංවර්ධනය කර බාහිර පාර්ශ්වයන් වෙත බැහැර කර ඇති ඉඩම් අක්කර 321 පර්චස් 3.03 කට අදාළව ඉඩම් සංවර්ධනය කිරීමට පෙර පැවති නොදියුණු වටිනාකම වූ රු.මිලියන 59.78 ක මුදල දෙපාර්තමේන්තුව විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වටිනාකම් බැර කිරීමට ආදායම් ශීර්ෂය සම්බන්ධයෙන් විමසීමක් එම සංස්ථාව විසින් සිදුකර ඇත. ඒ අනුව මුදල් ගිණුම්ගත කළයුතු ආදායම් ශීර්ෂය ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත මේ වන විට දැනුම් දී ඇත.ඒ අනුව එම මුදල් ලැබෙයැයි අපේක්ෂා කරනු ලබයි. | ඉඩම් සංවර්ධනය කිරීමට පෙර පැවති නොදියුණු වටිනාකම ඉඩම පවරාදීමට ප්‍රථම අයකර ගත යුතුය. |

## 3.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණව හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වැය විෂයයන් 14 ක් සඳහා වූ රු.මිලියන 75.4 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 31.4 ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. එම ඉතිරිවීම් මුලු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 ත් සියයට 82 ත් අතර පරාසයක පැවතුණි. එසේම මූලධන වැය විෂයන් 03 කට අදාළ මුලු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන 56 කින් ඉතිරිය රු.මිලියන 36.5 ක් වී තිබිණි. එම ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 20 ත් සියයට 78 ත් අතර පරාසයක පැවතුණි. | උරුමය ජාතික වැඩසටහන 2024 වර්ෂයේ කඩිනම් වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක විය. ඒ අනුව එම වැඩ සටහන වෙනුවෙන් ලැබුණ ප්‍රතිපාදන තුලින් ඉන්ධන, ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ මිලදී ගැනීම ඇතුළු වියදම් කළමනාකරණය කර ගන්නා ලදී. | නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

## 3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු.මිලියන | අනුකූල නොවීම | අදහස් දැක්වීම | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 135 වගන්තිය, භාණ්ඩාගාර | 2.37 | 2024 රජයේ වියදම් පාලනය සඳහා ලබා දී ඇති උපදෙස්, චක්‍රලේඛ හා නීති රීති රෙගුලාසි පිළිබඳ සැලකිල්ලකට නොගෙන නිලධාරීන්ට | රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත 2024 අයවැය යෝජනාවක් ලෙස ක්‍රියාත්මක වූ උරුමය වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම දෙපාර්තමේන්තුවට පැවරී | රජයේ වියදම් පාලනය සඳහා ලබා දී ඇති උපදෙස්,චක්‍ර ලේඛ අනුව |

| | | | |
|---|---|---|---|
| ලේකම්ගේ 2022 නොවැම්බර් 25 දිනැති අංක 08/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා 2024 ජනවාරි 10 දිනැති 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය. | ආහාරපාන සහ නවාතැන් පහසුකම් මෙන්ම දේශපාලන රැස්වීම් සඳහා ඉන්ධන හා රජයේ වාහන ලබා ගැනීම ආදී කරුණු සඳහා නීති රීති රෙගුලාසි වලට පටහැනිව දරා ඇති වියදම රු.මිලියන 2.37 ක් වී තිබුණි. | තිබුණි. එම නිසා රාත්‍රී කාලයේදී සේවය කිරීමට සිදු වූ බැවින් එම කාර්යයෙහි නිරත නිලධාරීන් සඳහා අවශ්‍ය ආහාරපාන,ප්‍රවාහන පහසුකම් ලබාදෙන ලදී. දීමනා පත්‍ර අදාළ රජයේ ආයතන වෙත බෙදා හැරීම සඳහා සේවා අවශ්‍යතාවය මත රාජකාරියෙහි නිතර නිලධාරීන්ට අවශ්‍ය නවාතැන් පහසුකම් ලබා දීමට සිදු වූ බව කාරුණිකව සඳහන් කරමි. | කටයුතු කළ යුතුය. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ප්‍රතිපත්තියක් තුළ මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනයේ චිරස්ථායී බව සහතික කරමින් රජයේ ඉඩම් ප්‍රශස්ථ මට්ටමින් සහතික කිරීමට මඟ පෙන්වමින් නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමනාකාරීත්වයක් පවත්වා ගෙන යෑම දෙපාර්තමේන්තුවේ ‘මෙහෙවර’ ලෙස දක්වා ඇතත්, ඉඩම් පිළිබඳ තොරතුරු හා දත්ත ලබාගැනීමේදී දෙපාර්තමේන්තුව තුළ බදුදීම්, ඉඩම් බෙදා හැර කිරීම්, දීමනාපත්‍ර ලබාදීම, බදු නිදහස් කිරීම, බදු සහන ආදී තොරතුරු ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් විගණිත දිනය වන 2025 අප්‍රේල් 30 දින වන විටද පවත්වා නොතිබුණි. | දෙපාර්තමේනතුවේ 'මෙහෙවර'දක්වා ඇති පරිදි ඉඩම් පිළිබඳ තොරතුරු හා දත්ත ලබා ගැනීමේදී දෙපාර්තමේන්තුව තුළ බදු දීම්, ඉඩම් බැහැර කිරීම්, දීමනා පත්‍ර ලබාදීම්, බදු සහන ආදී තොරතුරු අවශ්‍ය පරිදි සපයා ගැනීමට විධිමත් ක්‍රමයක් ලෙස E-Slim පද්ධති දැනටමත් ක්‍රියාත්මක වේ. විගණන නිරීක්ෂණ මඟින් අනාවරණය වූ කරුණු සළකා බලමින් E-Slim පද්ධතියේ දැනට පවතින්නාවූ අඩුපාඩු මඟහරවා ගැනීමට මේවන විට පියවර ගනිමින් පවතී. | ඉඩම් පිළිබඳ තොරතුරු ලබාගැනීමට හැකිවන පරිදි විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

### 4.2 සැලැසුම් කිරිම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 වර්ෂයන්හි ඉලක්කගත දත්ත කාර්යය සාධන වාර්තා තොරතුරු අනුව E-slims පද්ධතිය මගින් සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර 2,000 ක්,දීමනා පත්‍ර 40,000 ක් නිකුත් කිරීමට හා දීර්ඝකාලීන බදු 1,000 ක් පද්ධතියට ඇතුළත් කිරීමට සැලසුම් කර තිබුණද 2024 දෙසැම්බර් 31 වන විට බලපත්‍ර 917 ක්,දීමනා පත්‍ර 22,432 ක් නිකුත් කර ඇති අතර බදුකර 152 ක් ඇතුළත් බවට විගණනය වෙත වාර්තා කර තිබුණි. ඒ අනුව | පැවති රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස නිදහස් දීමනාපත්‍ර ලබා දීමේ (උරුමය) ප්‍රමුඛ වැඩසටහන ක්‍රියාත්මක වීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට නොහැකි වී ඇත. | කාර්යය සාධන වාර්තා සකස් කිරීමේදී ප්‍රායෝගික ඉලක්කයන් සඳහා සැලසුම් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එහි ප්‍රගතිය පිළිවෙලින් සියයට 46 ක් හා 56 ක් හා 15 ක් වී තිබුණි. | | |
| (ආ) | ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් හා අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන් වෙත 2023 දෙසැම්බර් 31 වන දිනට ප්‍රථම සියලුම බදු අනුමැතීන් සහ සියලු බදුකර සම්බන්ධ තොරතුරු E-slims පද්ධතියට ඇතුළත් කරන ලෙස උපදෙස් දී තිබුණි. බදු දී ඇති ඉඩම් කොපමණද යන්න තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර E-slims පද්ධතිය මගින් ලද තොරතුරු අනුව දීර්ඝකාලීන බදු ඉඩම් 7,517 ක තොරතුරු , පද්ධතියට ඇතුළත් කර තිබුණි.මෙම වාර්තාවේ දින වන විටත් රජයේ ඉඩම් බදු දීම තුළින් ඉපයූ ආදායම හා හිඟ බදු ආදායම් පිළිබඳ වාර්තා පද්ධතිය තුළින් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | දීර්ඝකාලීන බදු ඉඩම් සම්බන්ධ E-Slims පද්ධතියට ඇතුළත් කර ඇති තොරතුරුවලට අදාළ ඉපයූ ආදායම් සහ හිඟ බදු ආදායම් මේ වන විට පද්ධතිය තුළින් ලබා ගැනීමට හැකියාව පැවතියද ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙම පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සියයට 100 ක්ම තවමත් අනුගත වී නොමැති බැවින් ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගැනීමට කටයුතු කරමින් පවතී. | e-Slim පද්ධතියේ ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කළ යුතුය. |
| (ඇ) | පසුගිය වර්ෂයෙහි ක්‍රියාකාරී සැලැස්ම අනුව බදු ගෙවීම් ඇතුළු අනෙකුත් කාර්යයන් මාර්ගගත ක්‍රමයට සිදු කිරීමට බැංකු ගිණුම් 10 ක් මගින් සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ කිරීමට සැලසුම් කර තිබුණි. 2013 වර්ෂයේ ආරම්භ වූ මෙම E-slims පද්ධතිය දැනට වසර 11 ක් ගත වී ඇතත් නියමිත පරිදි බදු නිර්දේශ ලබා දී, බදු අනුමැතිය ලබා දීම හා බදු ගෙවීම මාර්ගගත ක්‍රමය මගින් සිදු කර ගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන විට නොහැකි වී තිබුණි. | මේ වන විට මාර්ගගත ගෙවීම් ද්වාරය සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇති පිළිවිතර සඳහා ලංසු කැඳවීම සඳහා රාජ්‍ය බැංකු දෙක ප්‍රතිචාර දක්වා නොමැති බැවින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත සියළු බැංකු වෙතින් ලංසු කැඳවීමට තීරණය කර ඇත. | බදු ගෙවීම් ඇතුළු අනෙකුත් කාර්යයන් මාර්ගගත ක්‍රමයට සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (E-slims) 2016 වසරේදී ආරම්භ කර වසර 05 ක කාලයක් තුළදී රු. මිලියන 119.6 ක ඇස්තමේන්තුවක් මත පද්ධතිය සම්බන්ධ සියලු කාර්යයන් අවසන් කිරීමට සැලසුම් සකස් කර තිබුණි. නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1 වන පරිච්ඡේදයේ 1.1 හා 1.2.1 ඡේදයන්හි සඳහන් වන පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු නොවීම නිසා මෙම පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ආයතනයක් තෝරා ගැනීමට නොහැකි | 2003 අංක 27 දරණ තොරතුරු සන්නිවේදන තාක්ෂණ පනත සහ එහි සංශෝධිත 2008 අංක 33 දරණ පනතින් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙ අංශයන්ට උපාය මාර්ග සහ වැඩසටහන් e-රාජ්‍ය සංකල්පය ඔස්සේ ක්‍රියාත්මක කිරීමටත්, ඒ හා සම්බන්ධ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය වෙත පවරා දී තිබූ බලතල අනුව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව මගින් ලද අනුමැතිය මත 2008 වසරේදී එවකට පැවති ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයත්, ඉඩම් කොමසාරිස් ජනරාල් | සේවා ලබා ගන්නා ආයතනය සමග විධිමත්ව ගිවිසුම්ගතවී අවශ්‍යතාවයට ගැලපෙන පරිදි පද්ධතිය කඩිනමින් යාවත්කාලීන කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වී තිබුණි. 2013 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ රු. මිලියන 226.89 ක් මෙම කාර්යය සඳහා රජයේ මුදල් වැය කර ඇතත් රජයේ ඉඩම් කළමනාකරණය කිරීමට හා බදු මුදල් අයකර ගැනීමට පහසු වන පරිදි මෙම පද්ධතිය සාර්ථක වී නොතිබුණි. | දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) ඒකාබද්ධව අවබෝධතා ගිවිසුමක් අත්සන් කොට රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියක් (e-Slims) ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන බව සඳහන් කරමි.<br>ඉදිරියේදී නියමිත ක්‍රියාකාරි සැලැස්මකට අනුව කාර්යන් ඉටු කිරීමට අවධානය යොමු කර ඇත. | |

## 4.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට අයත් රත්මලාන ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිල්ලක් ශ්‍රවණාගාරයක් බවට පත්කිරීම සඳහා රු. මිලියන 4.59 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණි. තවද, එම ගොඩනැගිල්ල වෙත රු. මිලියන 12.99 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩද සපයා තිබුණි. මීට අමතරව විශාල ප්‍රමාණයේ වායු සමීකරණ යන්ත්‍ර 04 ක්ද සවිකර තිබුණි. තවද එම ගොඩනැගිල්ලේම කොටසක් පරිගණක මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා රු. මිලියන 5.58 ක මුදලක් වැය කරමින් පරිගණක හා උපාංග මිලදීගෙන තිබුණි. නමුත් මෙම ශ්‍රවණාගාරය හා පරිගණක මධ්‍යස්ථානය ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය. | ශ්‍රවණාගාරය ප්‍රශස්ථ අයුරින් වෙනත් රාජ්‍ය ආයතන වෙත ඔවුන්ගේ වැඩසටහන් පැවැත්වීම සඳහා ලබාදීමට හා අමාත්‍යාංශයෙන් ලද අනුමැතිය මත සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.<br>කොළඹ හා ඒ අවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන්ට eslims පුහුණු කටයුතු පැවැත්වීමට හා එම පද්ධතිය වෙත බදු ගොනු තොරතුරු අවට ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන් මගින් ඇතුළත් කිරීමටද පියවර ගෙන ඇත. 2024 වසරේදී මෙම පරිගණක විද්‍යාගාරය "උරුමය" වැඩ සටහනේ දත්ත ඇතුළත් කිරීමේ කටයුතු සඳහා යොදාගත් අතර 2021/ 2022 වසර වලද e-Slims පුහුණු කටයුතු සඳහා යොදාගෙන ඇත. | ගොඩනැගිල්ල සහ එහි පවත්නා උපකරණ පූර්ණ උපයෝජනයට ගත හැකි ආකාරයට වැඩසටහන් සකස් කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 411 කින් 2024 වර්ෂයේදී අය කරගෙන ඇති නිවාස කුලී පිළිබඳ විස්තර විගණනය වෙත ඉදිරිපත් නොවුණි.නීත්‍යානුකූල ක්‍රමවේදයක් මත නිල නිවාස කුලී පදනම මත ලබා නොදීම, නිල නිවාසවල හා එම භූමියේ අනවසර පදිංචිකරුවන් ඉවත් නොකිරීම,ගොඩනැගිලි අලුත් වැඩියා නොකිරීම,ගොඩනැගිලි පිහිටා ඇති ඉඩම් මැනීම, පිඹුරුපත් සැකසීම, අයිතිය පවරා ගැනීම්, එම මායිම් සැකසීම හා ඉඩම් ආරක්ෂා කිරීම වැනි කරුණු නිසි පරිදි සිදු නොවීම හා කුලී ගාස්තු අයවීම | නිල නිවාස කුලී අයවීම පිළිබඳව මාසික වාර්තාව නිසි පරිදි යොමු කරන ලෙස අදාළ කාර්යාල දැනුවත් කිරීම සඳහා පියවර ගෙන ඇත.<br>අනවසරකරුවන් පදිංචි වී සිටින නිල නිවාස හා එම අනවසරකරුවන් පදිංචිය ඉවත් කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද යන්නත්, අලුත්වැඩියා කළයුතු නිල නිවාස හා ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමට අදාළව ප්‍රමුඛතා ලේඛණයක් සකස් කිරීම හා ඉඩම් හා නිල නිවාස වඩාත් ඵලදායීව භාවිතා කිරීමට හැකියාව ඇති රාජ්‍ය ආයතන වෙත ලබාදීම පිළිබඳ | නිල නිවාස කුලී අයකර ගැනීමට මෙන්ම ඒවා තක්සේරු කර ගිණුම් ගත කිරීම හා අනවසර පදිංචිය ඉවත් කිරීමට අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කර නොතිබුණු අතර නිල නිවාස 261 ක් තක්සේරු කර ඇති අතර නිවාස 98 ක් සඳහා දළ තක්සේරුව ලබාගෙන තිබුණි. එම නිල නිවාස වලින් 30 ක අනවසර පදිංචිකරුවන් සිටින අතර නිවාස 35 ක් රාජ්‍ය ආයතන වෙත පැවරීමට කටයුතු කරමින් පැවති අතර එයින් නිවාස 07 ක් පවරා තිබුණි. | තොරතුරු 2025.03.17 දිනට පෙර දන්වන ලෙස මාගේ අංක LCGD/AD/8/නිල නිවාස,ඉඩම් හා ගොඩනැගිලි/2025 හා 2025.03.11 දිනැතිව ලිපිය මගින් සියලුම කාර්යාල වලට දැනුම් දී ඇත. අන්තර් පළාත් කාර්යාල මගින් යොමු කරන ලද වාර්තා අනුව අනවසර පදිංචිකරුවන් ප්‍රමාණය 20 ක් වේ. ඒ සම්බන්ධව ඉදිරියේදී පියවර ගැනීමට නියමිතය.<br>නිල නිවාස,ඉඩම් හා ගොඩනැගිලි 117 ක් සඳහා මේ වනවිට දළ තක්සේරුව ලබාගෙන ඇති අතර 33 ක් සඳහා තවදුරටත් දළ තක්සේරු වාර්තා ලබාගත යුතුව ඇත. | |
| (ඇ) | ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රයෝජනය සඳහා 2021 ජනවාරි 21 දින රු.මිලියන 25.07 ක් වැය කර ඉදිකරන ලද නිල නිවස ඉදිකළ දිනයේ සිට එහි පදිංචියක් නොමැති අතර නඩත්තු කටයුතුද සිදුකර නොමැත. තවද නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොකිරීම නිසා දිනෙන් දින මෙම ගොඩනැගිල්ල අභාවයට යන තත්ත්වයක් දක්නට ලැබුණි. | දෙපාර්තමේන්තුව සඳහා වෙන්වන සීමිත ප්‍රතිපාදන මත හා ප්‍රාදේශීය කාර්යාලවල නිල නිවාස හා ගොඩනැගිලිවල ඇති අසීමිත දුෂ්කරතා වළක්වාලනු සඳහා මුදල් වෙන්කිරීමේදී වැඩි සැලකිල්ලක් දැක්විය යුතු බැවින් අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවන් පමණක් මෙම නිල නිවස සඳහා සිදු කර ඇත. | නිල නිවස නිසි පරිදි නඩත්තු කර එහි පදිංචියට පියවර ගත යුතුය. |

**4.5 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මුහුදෙන් වැලි ගොඩබිමට ඉවත් කිරීමේ ගිවිසුමක් 2018 ජනවාරි 16 දින විදේශීය සමාගමක් සමඟ අත්සන් කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 6,778.04 ක් වටිනාකමට මුහුදු වැලි අලෙවි කර සංස්ථාව විසින් ආදායම උපයාගෙන තිබුණි. නමුත් 1957 රාජ්‍ය සන්තක ඉඩම් පිළිබඳ ආඥා පනතේ 08 වැනි කාණ්ඩයේ 58 සිට 67 දක්වා වගන්තිවලට අනුව මුහුදු පතුලෙන් යම් ද්‍රව්‍යයක් ලබා ගන්නේ නම් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අනුමැතිය අනුව සිදුකළ යුතු බව සඳහන්ව ඇති අතර ඒ සඳහා ගාස්තුවක් අය කළ යුතු බවද සඳහන් වී තිබුණි. නමුත් රු.මිලියන 6,778.04 ක් වූ වටිනා වැලි ඉවත් කිරීමේදී ලබාගත් අනුමැතියක් හෝ යම් මුදලක් රජයට අයකර ගත් බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. ඒ අනුව මෙම ක්‍රියාවලියේදී අවම වශයෙන් රු.මිලියන | රජයේ ඉඩම් ආඥා පනතේ 60 සිට 63 වන වගන්ති අනුව මුහුදු පත්ලේ සිදුවන කාර්යන් සඳහා අනුමැතිය ලබා දීම ගරු ජනාධිපතිවරයා හා ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදුකළ යුතු වුවද 2019 වසරේ සිට 2023 වසර දක්වා මුහුදු වැලි ඉවත් කිරීමේ වෙනුවෙන් ඉඩම් සංවර්ධන කිරීමේ සංස්ථාව විසින් මෙම දෙපාර්මේන්තුව වෙතින් අවසරයක් ඉල්ලා නොමැති අතර ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ඉහත කී කාර්යය සඳහා කොපමණ ඉඩම් ප්‍රමාණයක් පරිහරණය කලේ ද, කැනීම් කරන ලද මුහුදුවැලි කියුබ් ප්‍රමාණය, සමගින් ඉපැයූ අදායම් හා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් Rhoad Neilson A/C නැමති විදේශීය සමාගම සමඟ ඇතිකර ගන්නා ලද ගිවිසුම සම්බන්ධයෙන් 2025.05.19 දිනැති ලිපිය මඟින් එම සංස්ථාව වෙතින් විමසීමක් කර ඇති අතර, මේ සඳහා ගාස්තු අයකිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් කෘෂිකර්ම, | අවසරපතක් ලබා නොගෙන වැලි කැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම සහ අයවීමට ඇති මුදල අයකර ගැනීම සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 271.1 කට ආසන්න පාඩුවක් රජයට සිදුවී ඇති බව විගණනයේදී නිරීක්‍ෂණය විය. | පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය වෙතින් 2025.05.19 දිනැතිව උපදෙස් ඉල්ලා ඇත. ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂිතය. | |

## 4.6 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ 2019 වර්ෂයේ දී ශක්‍යතා අධ්‍යයනයකින්,නිසි සැලසුමකින් හා සොයා බැලීමකින් තොරව දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරා ගැනීමට පෙර පර්චස් 30 ක බිම් කොටසක් සංචාරක බංගලාවකට ලබාගෙන එම ගොඩනැගිල්ලෙහි කොටසක් පමණක් ඉදිකර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වැය කර ඇති මුදල රු.මිලියන 10.42 ක් වූ අතර බංගලාවෙහි ඉදිකිරීම් වැඩ නිම නොකර රු.මිලියන 0.32 ක ලී බඩු උපකරණද මිලදී ගෙන ඉදිකිරීම් කටයුතු නවතා දමා නිසි ප්‍රයෝජනයකින් තොරව විනාශ වෙමින් පැවතිණි.මෙම ගොඩනැගිල්ල වැඩ අවසන් කර භාවිතයට ගැනීම සඳහා රාජ්‍ය ආයතන කිහිපයක් විසින් ඉල්ලීම් කර ඇතත් ඉදිකර වර්ෂ 05 කට ආසන්න කාලයක් කිසිදු කටයුත්තක් සඳහා ප්‍රයෝජනයට නොගෙන විනාශවීමට ඉඩහැර තිබුණි. | 2025 මාර්තු මස ඉඩම් කොමසාරිස් ජනරාල් කිලිනොච්චි සංචාරක බංගලාව වෙත ගොස් මේ සම්බන්ධව නිරීක්ෂණය කර දිස්ත්‍රික් ලේකම් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් විසින් උක්ත සංචාරක බංගලාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාරදෙන ලෙස ඉල්ලීමක් යොමු කර ඇති අතර ඒ අනුව කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් වෙත භුක්තිය බාරදීමට ඉදිරි පියවර ගෙන ඇත. | ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | උරුමය ඔප්පු බෙදාදීමේ ජාතික ව්‍යාපෘතිය සඳහා ජනපද නිලධාරීන්ට හා ඉඩම් නිලධාරීන් වෙත රු.මිලියන 1.19 ක මුදලක් ඉන්ධන දීමනාවක් හිමි නොවූ නිලධාරීන් වෙත ගෙවීම කර තිබුණි. ඒ සඳහා විධිමත් අනුමැතියක් නොතිබීම මෙන්ම නීතිමය ප්‍රතිපාදන නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. | උරුමය වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ජනපද නිලධාරීන්/ ඉඩම් නිලධාරීන් වෙනුවෙන් 2024.04.01 දින සිට 2024.12.31 දින දක්වා කාලය සඳහා ප්‍රවාහන කටයුතු වෙනුවෙන් මසකට රු. 2000 බැගින්, ඉන්ධන දීමනාවක් ලබා දීම සඳහා ජනාධිපති ලේකම්ගේ අංක PS/FIN/FD/Rqt/05/02(iv) හා 2024.07.11 දිනැති ලිපියෙන් අදාළ ප්‍රතිපාදන වෙන් කර ඇත. | දීමනා ගෙවීම සඳහා විධිමත් අනුමැතියක් ගත යුතුය. |

## 4.7 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වාණිජ පදනමින් දීර්ඝ කාලීන බදු දී ඇති ඉඩම් ගොනු අතරින් 2021 පෙබරවාරි 01 | මේ සම්බන්ධව 2025.03.25 දින පැවති විගණන කළමනාකරණ කමිටුවේ තීරණය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම් වෙත අදාළ අනුමැතිය සඳහා යොමු කර ඇත. | බදු සහන පිළිබඳව නැවත සලකා බැලීමත් අයවිය යුතු හිඟ බදු අය කිරීමටත් |

| | | | |
|---|---|---|---|
| | දිනැති අංක 2020/06 (1) චක්‍රලේඛය ප්‍රකාරව දෙවන බදු කාලය ආරම්භ වන,දීර්ඝ කාලීන වාණිජ බදු ගොනු 82 ක් පවතින බව නිරීක්ෂණය වූ අතර ඉහත චක්‍රලේඛය හා ඊට අදාළ අමප/20/1622/322/004 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දෙවන බදු කාලය ආරම්භ වන දිනයේ සිට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දුන් 2020 නොවැම්බර් 16 දින දක්වා දෙවන බදු කාලයට අදාළව ගනු ලැබූ තක්සේරුව මත බදු මුදල් නිවැරදිව ගණනය කර අය කළ යුතු වුවත් ඊට පටහැනිව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2022 නොවැම්බර් 10 දිනැති අංක 4/10/ පොදු /බදු සහන (L2 ) ලිපිය අනුව බදු ගොණු 08 ක් සම්බන්ධයෙන් වූ බදු අය කළ යුතු ආකාරය දන්වා එවා තිබීම නිසා රු.මිලියන 70.52 ක බදු මුදලක් අහිමි වී තිබුණි. චක්‍රලේඛය අභිබවා බදු සහන ලබා දීමට කටයුතු කර තිබීම නිසා බදු ගොනු 82 න් බදු ගොනු 74 ක බදුකරුවන් බදු ගෙවීම් අධෛර්යමත් වීමේ අවධානමක් ඇති විය හැකි බව 2023 වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන්නද 2025.04.28 දින වන විටත් නිවැරදි කිරීම් සිදුකර නොතිබුණි. | | ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතු සංචාරක බංගලා 08 ක් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා බාහිර ආයතන වෙත ලබා දීම කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අනුරාධපුරය සහ නුවරඑළිය සංචාරක බංගලාවන්හි සැලකිය යුතු පිරිසක් නවාතැන් ගෙන ඇතත් අනෙකුත් සංචාරක බංගලා 06 හි ඉතා අඩු සංඛ්‍යාවක් නවාතැන්ගෙන තිබුණි. මෙම සංචාරක බංගලා පවත්වා ගෙනයාම වෙනුවෙන් දැරීමට සිදුවූ පුනරාවර්තන වියදම රු.මිලියන 5.22 ක්වූ අතර ආදායම රු.මිලියන 1.7 ක් විය. සංචාරක බංගලා පැරණි ඒවා වීම,නඩත්තු කටයුතු සිදු නොකිරීම,වෙන්කිරීමේ අපහසුතා, ආරක්ෂාව දුර්වල වීම, කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු හා ගාස්තු අයකිරීමේ පවතින විෂමතා සංචාරක බංගලා පවත්වාගෙන යාමේ අරමුණු ඉටු නොවීමට ප්‍රධාන ලෙස බලපා තිබුණි. | සංචාරක බංගලා 08 අතුරින් අනුරාධපුරය, පොළොන්නරුව, නුවරඑළිය හා කතරගම සංචාරක බංගලා සඳහා නිලධාරීන් වෙතින් ලැබෙන ඉල්ලීම් අනුව වැඩි වශයෙන් වෙන් කිරීම් සිදු කරනු ලබන අතර මහියංගනය, මොණරාගල, අම්පාර හා හම්බන්තොට සංචාරක බංගලා සඳහා රාජකාරී පදනම මත බොහෝවිට වෙන් කිරීම් සිදු වේ.<br>වාර්ෂිකව මෙම අලුත්වැඩියා සඳහා රු.මිලියන 10 ක් සහ ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් යටතේ වැට/තාප්ප/ගේට්ටු ඉදිකිරීම සඳහා රු.මිලියන 0.1 ක් පමණ ප්‍රතිපාදන වෙන් වන අතර, එකී ප්‍රතිපාදන වෙන් වනුයේ මෙම දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යාලය, රත්මලාන නිල නිවස, ජල්තර නිල නිවස හා අන්තර් පළාත් කාර්යාල හා ඊට අයත් සංචාරක බංගලා, නිල නිවාස, ගොඩනැගිලි 402 ක් සඳහාය. එබැවින් ඒ | සංචාරක බංගලා සම්බන්ධ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කළ යුතු අතර අළුත්වැඩියා කටයුතුද සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අතුරින් අත්‍යාවශ්‍යයෙන්ම කළයුතු අලුත්වැඩියාවන්ට පමණක් ප්‍රමුඛතාවය ලබාදෙමින් අලුත්වැඩියා කටයුතු සිදුකරනු ලබයි. සංචාරක බංගලාවන්හි ගාස්තු සංශෝධනය කර කෘෂිකර්ම,ඉඩම්,පශු සම්පත් හා වාරිමාර්ග අමාත්‍යාංශය ලේකම් මඟින් මුදල් අමාත්‍යාංශය වෙත මාගේ අංක LCGD/AD/19/සං.බං.ගාස්තු සංශෝධන/2025 හා 2025.05.02 දිනැති ලිපිය මගින් අනුමැතියට යොමුකර ඇත. | |
| (ඇ) | 1996 ඔක්තෝබර් 31 දින ලංකා වානේ සංස්ථාවට අයත් අක්කර 182 ක ඉඩම හා එහි පිහිටි කර්මාන්තශාලාව සහිත සියලුම වත්කම් හා වගකීම් ඇ.ඩො. මිලියන 15 කට කොරියන් සමාගමක් වෙත ගිවිසුම්ගතව පවරා තිබුණද එම විදේශීය සමාගම ගිවිසුම අනුව ක්‍රියාත්මක නොවීම මත මෙම ඉඩම දේශීය සමාගමක් වෙත නැවත පවරා ගෙන තිබුණි. රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය අනුව ඉඩමක් බාහිර පාර්ශවයක් වෙත නිදහස් කිරීමට අදාළව සිදුවිය යුතු ක්‍රියාදාමයක් අනුගමනය නොකර විදේශීය සමාගම වෙත මෙම ඉඩම ලබාදී තිබුණි. 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ දීමනා පත්‍රයක් මගින් ඉඩම පැවරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී නොදීමත්, නීතිපතිවරයා විසින් ලබා දුන් උපදෙස් පරිදි කොන්දේසි ඇතුළත් කරමින් කර්මාන්ත ශාලාව ක්‍රියාත්මක වන ඉඩම් ප්‍රමාණය පමණක් ලබාදීමට කටයුතු නොකිරීමක් නිරීක්ෂණය වූ අතර වර්තමානය වනවිට කර්මාන්ත ශාලාවෙහි කටයුතුවල ප්‍රගතියක් දක්නට නොලැබෙන අතර ආරම්භක ගිවිසුම අනුව ක්‍රියාත්මක නොවන තත්ත්වයක් තුළ එම ඉඩම යලි පවරා ගැනීමකට කටයුතු කර නොතිබුණි. එසේම දැනට කර්මාන්තශාලාව සඳහා භාවිතයට නොගන්නා ඉඩමෙහි ක්‍රීඩා පිටියක් හා අබලන් වෙමින් පවතින නිල නිවාස පවතින අතර එම ඌන උපයෝජිත අක්කර 160 ක පමණ ප්‍රමාණය පිළිබඳ ඉඩම් අමාත්‍යාංශය විසින් තිරණයක්ද ගෙන නොතිබුණි. | 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ 1961 වර්ෂයේ ලංකා වානේ සංස්ථාව පිහිටුවා ඇති අතර පසුව මෙම ඉඩම වානේ සංස්ථාව සඳහා අත්පත් කරගෙන 44 වන වගන්තිය යටතේ පැවරුම් සහතිකයක් නිකුත් කර ඇත. 1996 වර්ෂයේ රාජ්‍ය සමාගම් පෞද්ගලීකරණය කිරීම යටතේ වානේ සමාගමෙහි සියයට 90 ක කොටස් කොරියානු සමාගම වෙත විකුණා ඇත. 2009 වර්ෂයේ දී එම සමාගම සතු කොටස් දේශීය ආයතනයක් විසින් මිල දී ගෙන තිබුණි.<br>1987 අංක 23 දරන පනත යටතේ පුද්ගලීකරණය කළ රජය සතු ව තිබූ රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා ව්‍යවස්ථාපිත භාරයේ තිබූ ඉඩම් වටිනාකම ගෙවා ඇත්නම් එම ඉඩම්වල අයිතිය දීමනාපත්‍රයක් මඟින් ලබා ගත යුතු බව එම පනතෙහි දක්වා ඇත. ඒ අනුව මෙම ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් කමිටුවක් පත්කර එම කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස ද සඳහන් කර ඇත.<br>තව ද ප්‍රශ්නගත ඉඩමේ කොටස්වල අගයන් ගණනය කිරීම සහ තක්සේරුව පිළිබඳ ව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් කරන ලද විමසීමකට අනුව ආයෝජකයා විසින් සියයට 90 ක කොටස් සඳහා ඇ. ඩො. මිලියන 15 ක මුදලක් ගෙවා ඇති බව ද වත්කම් වෙන වෙන ම තක්සේරු නොකර සමස්ත ආයතනය සඳහා ම තක්සේරුව ඉදිරිපත් කර ඇති බව ද නීතිපති විසින් ද අනුමත කරන ලදුව අදාළ විකිණුම් හා මිලදී ගැනීම් ගිවිසුම මගින් ආයෝජකයා වෙත ලබා දීම සිදු කර ඇති බව ද දන්වා ඇති බව වැඩිමනත් වශයෙන් දක්වමි. | ඉඩම පවරාදීම මෙතෙක් සිදුවී නොමැති බැවින් පුළුල් පරීක්ෂණයකින් පසුව අවශ්‍ය ඉඩම් ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1982 ඉඩම් අත්පත් කර ගැනීමේ පනතෙහි 38(අ) වගන්තිය ප්‍රකාරව පවරා ගත් කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 492/D රජමල්වත්ත ග්‍රාම නිලධාරී වසමෙහි මු.පි. 9302 පිඹුරෙහි කැබලි අංක 02 දරන හෙක්ටයාර 0.0506 ක් හෙවත් පර්චස් 20 ක් පුද්ගලික පාර්ශවයක් වෙත නේවාසික පදනමින් වසර 30 ක් සඳහා වාර්ෂිකව රු.මිලියන 0.8 ක මුදලකට බදු දී තිබුණි. 2025 පෙබරවාරි 20 දින වන විට අදාළ පුද්ගලයා මෙම ඉඩමෙහි නේවාසිකව පදිංචිව නොසිටි බව නිරීක්ෂණය විය. වාණිජ නගරයක් වන බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි මෙම ඉඩම රජයේ අවශ්‍යතාවයක් සඳහා අත්කර ගෙන භාහිර පාර්ශවයක් වෙත නේවාසික පදනමින් බදු දී තිබුණි. නමුත් රජයේ අවශ්‍යතාවයක් නොමැතිනම් වාණිජ වටිනාකමක් ඇති මෙම ඉඩම වාර්ෂික තක්සේරු වටිනාකම සියයට 4 ක බදු යටතේ ලබාදීමට හැකියාව පැවතියද මෙම ක්‍රියාව නිසා රජයට පාඩුවක් සිදුවී තිබුණි. | මෙම ඉඩම් කොටස නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ 1982 දී රජය වෙත පවරා ගෙන ඇති අතර 1997 වර්ෂයේ දී කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශය වෙත පවරා ඇත. 2012 වර්ෂයේ දී එම ඉඩම් කොටස කෘෂිකර්ම, ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශය යටතේ සංවර්ධන කාර්යයන් සඳහා යොදා නොගන්නා බැවින් දීර්ඝකාලීන ව බදු ලබා දීම සම්බන්ධව විරෝධතාවක් නොමැති බව එවකට ඉඩම් කොටසෙහි අයිතිය පැවති කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇත.<br>ඒ අනුව, පළාත් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව නිර්දේශ වාර්තා ඉදිරිපත් කරන ලදුව මෙම ඉඩම සඳහා 2012.07.26 දිනැතිව දීර්ඝකාලීන බදු අනුමැතිය ලැබී ඇත. රජයේ ඉඩම් දීර්ඝකාලීන බදු පදනම මත බැහැර කිරීමේ දී වෙන්දේසි, ටෙන්ඩර් වැනි තරගකාරී ක්‍රමවේද හෝ ඉඩම් කච්චේරි වැනි ක්‍රමවේද අනුගමනය කරමින් බදුකරුවන් තෝරාගැනීම සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ විධිවිධාන සලසා ඇත. එසේ වුව ද බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව, ඉදිරිපත් කරන ලද නිර්දේශ මත මෙම ඉඩම බැහැර කිරීම සඳහා ඇමතිතුමාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව 2019.02.03 දිනැති ව 4/10/35274 දරන බදුකරය මගින් මෙම ඉඩම බැහැර කර ඇත. අදාළ ප්‍රශ්නගත ඉඩම් කොටස නැවත පවරා ගෙන රජයට වාසිදායක ආකාරයට ක්‍රියාකළ යුතු බවට 2025.03.14 දිනැති විගණන විමසුම මගින් පෙන්වා දී ඇති බැවින් ඒ සඳහා ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් 2025.05.21 දිනැතිව කාෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය වෙතින් උපදෙස් ඉල්ලා ඇත. | විධිමත් ආකාරයට ඉඩම බැහැර කිරීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඉ) | උරුමය වැඩසටහන යටතේ නිදහස් දීමනා පත්‍ර ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අනුමත කර E-slims පද්ධතියට ඇතුළත් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව 63,818 ක් වුවත් ඒ සඳහා “O” රේඛා චිත්‍ර 38,396 ක් ලබාදී තිබුණද දීමනා පත්‍ර සකස් කර අවසන් කර ඇත්තේ 12,468 ක් හෙවත් සියයට 19 ක ප්‍රමාණයක් විය. ඒ අනුව උරුමය වැඩසටහන පළමු හා දෙවන අදියර යටතේ ලබාදුන් මුළු නිදහස් දීමනා පත්‍ර සංඛ්‍යාව 22,362 ක් පමණක් විය. | | |
| i | දෙපාර්තමේන්තුවෙහි ස්ථිර රාජකාරි ඉටුකරන නිලධාරීන් නිත්‍ය රාජකාරී කටයුතුවලින් ඉවත්කර උරුමය වැඩසටහන සඳහා 2023 ජුලි 16 දින සිට නැවත දැනුම් දෙනතුරු අධීක්ෂණ නිලධාරීන් 07 දෙනෙකු සහ විෂය නිලධාරීන් 60 කට ආසන්න සංඛ්‍යාවක් උරුමය වැඩසටහනේ රාජකාරි කටයුතු සඳහා නිදහස් කර තිබුණි.එසේම සකස් කරනු ලැබූ දීමනා පත්‍ර දිවයින පුරා බෙදාහැරීම ක්‍රියාත්මක කර ඒ සඳහා වාහන වෙනුවෙන් ඉන්ධන වියදම ලෙස දැරූ වියදම රු.මිලියන 12.1 ක් විය. | පැවති රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වැය ශීර්ෂ යටතේ රජයේ ප්‍රතිපාදන වෙන්කිරීම මත අදාළ වියදම් දරා ඇත. | ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| ii | ප්‍රදාන පත්‍ර මුද්‍රණයට Conquer Paper 40,000 ක ප්‍රමාණයක් රු.මිලියන 3.5 ක් වැයකර මිලදී ගෙන මෙම කඩදාසි තොගයෙන් රු.මිලියන 1.05 ක් වටිනා පැකට් 24 ක් 2025 අප්‍රේල් 30 දින වන විට ස්ථාන දෙකක නිෂ්කාර්ය පවතින බව නිරීක්ෂණය විය. | උරුමය වැඩසටහන තාවකාලිකව අත්හිටුවා ඇතත් මේ සම්බන්ධව කමිටු තීරණය කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර එම තීරණය අනුව ආරම්භ කිරීමට නියමිත වේ. එසේ නොවුනහොත් මෙම කඩදාසි රෙජිස්ටාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව වෙත හෝ වෙනත් සුදුසු ආයතනයකට ලබා දීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍යතාවය ඇගයීමකට ලක් කර මිලදී ගැනීම් සිදු කළ යුතුය. |
| iii | උරුමය වැඩසටහන යටතේ මිලදීගත් රු.මිලියන 32.64 ක් වටිනා පරිගණක 36 ක් සංවර්ධන අංශයට ලැබී අතිරික්තයක් වූ බැවින් පරිගණක 12 ක් ආපසු ගබඩාවට භාරදී තිබුණි. එසේම රු.මිලියන 5.95 ක් වියදම් කර මිලදීගත් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 15 ක් මෙම අංශය වෙත ලැබී ඒවාද නැවත ගබඩාව වෙත භාරදී තිබුණි.මෙම අංශය වෙත ඡායා පිටපත් යන්ත්‍ර 03 ක් තිබියදී තවත් ඡායා පිටපත් යන්ත්‍ර 09 ක් උරුමය වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කිරීම | දෙපාර්තමේන්තුවේ පරිගණක අවශ්‍යතාවයන් සඳහා නිකුත් කිරීමට හැකි වන පරිදි උරුමය වැඩසටහන වෙනුවෙන් භාවිතා කළ අතිරික්ත පරිගණක (මේ වන විට උරුමය වැඩසටහන් ක්‍රියාත්මක නොවන බැවින්) ගබඩාව වෙත භාර දී ඇත. | අවශ්‍යතාවය ඇගයීමකට ලක් කර මිලදී ගැනීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා ලබා දී තිබුණි. 2025 අප්‍රේල් 30 දින වන විට උරුමය වැඩසටහන ක්‍රියාත්මක නොවීම නිසා මෙම අංශය සතුව ඡායා පිටපත් යන්ත්‍ර 10 ක් නිශ්කාර්යව පවතින තත්වයක් නිරීක්ෂණය විය. මෙම යන්ත්‍ර 2024 මැයි 16 දින රු.මිලියන 4.13 ක් වියදම් කරමින් මිලදී ගෙන තිබුණි. | | |
| (ඊ) | සාමාන්‍ය රාජකාරි කටයුත්තක් ලෙස ඉටුකිරීමට තිබුණු රාජකාරි කඩිනමින් ඉටුකිරීමට යාම නිසා උරුමය වැඩසටහනට වෙනුවෙන් විශ්‍රාමික පරිපාලන සේවයේ නිලධාරීන් 08 දෙනෙකු 2024 මැයි මාසයේ සිට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන රු.මිලියන 3.56 ක මුදලක් ගෙවීම් කර තිබුණි. භාණ්ඩාගාරය විසින් නිකුත් කළ ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 ප්‍රකාරව කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් බඳවාගත නොහැකි වුවත් මෙම නිලධාරීන් කඩිනමින් ඔප්පු සකස් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ජංගම සේවා පැවැත්වීමට, රාජ්‍ය උත්සව ආකාරයට ඔප්පු ප්‍රදානය කිරීම ඒ සඳහා ජනාධිපතිවරයා ඇතුළු මැති ඇමතිවරු සහභාගී වීම කාර්යයන් මෙම නිලධාරීන් ඉටුකර තිබුණි. මීට අමතරව තාවකාලික පදනම මත විශ්ව විද්‍යාල, කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල අධ්‍යාපනය හදාරණ සිසුන් 11 ක් බඳවාගෙන 2024 මැයි මස සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා එක් දිනයක් සේවය කිරීම වෙනුවෙන් රු.1,500 ක් බැගින් එම සිසුන් සඳහා රු.මිලියන 1.62ක් ගෙවීම් කර තිබුණි. | උරුමය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා විශ්‍රාමික පරිපාලන සේවයේ නිලධාරීන් යොදවා ගැනීම ජනාධිපති ලේකම්ගේ අංක PS/PSB/SAS-4/Req/2024/1 හා 2024.04.05 දිනැති අනුමැතිය මත සිදුකර ඇත. 2024.05.27 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය මත කාර්මික විද්‍යාල සිසුන් තාවකාලික පදනම මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා බඳවාගෙන ඇති අතර ජනාධිපති ලේකම්ගේ අංක PS/FIN/FD/Rpt/05/02(vi) සහ 2024.08.20 දිනැති උපදෙස් මත දීමනා ගෙවීම් සිදුකර ඇත. | අවශ්‍යතාව හා අදාළ අනුමැතීන් මත බඳවා ගැනීම් සිදු කර අපේක්ෂිත කාර්ය සාධනය ඉටුකර ගත යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | | | |

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනම මත | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 95 | 36 | - | 59 |
| තෘතීක | 38 | 05 | - | 33 |
| ද්විතීයික | 710 | 458 | 09 | 252 |
| ප්‍රාථමික | 121 | 92 | - | 29 |
| එකතුව | 964 | 591 | 09 | 373 |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සහකාර ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් යන තනතුරු සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව 26 ක් වුවත් 2023 හා 2024 වර්ෂයන් තුළදී නිලධාරීන් 05 දෙනෙකුට පමණ අනුප්‍රාප්තිකයකු රහිතව ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 වන විට එම තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාව 13 ක් පමණ වී තිබුණි. | එකඟ වේ. ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි අදාළ නිලධාරීන් නිදහස් කරන ලෙස නියෝග කර ඇති බැවින්, නිලධාරීන් දිගු කාලයක් එකම සේවා ස්ථානයක සේවය කිරීම, දැඩිපෞද්ගලික අවශ්‍යතා සහ සාධාරණ හේතු සලකා ස්ථාන මාරු ලබා දීම සිදු කර ඇත. | ස්ථාන මාරු ලබා දීමේදී පවතින පුරප්පාඩු පිලිබඳ අධ්‍යනයක් කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරීන් හා කළමනාකරන සේවා නිලධාරීන්ගේ පුරප්පාඩු 2024 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් 33 ක් හා 74 ක් පමණ වූ නමුත් 2023 හා 2024 වර්ෂයන් වලදී එම තනතුරු පිළිවෙළින් 18 ක් හා 17 ක් සඳහා අනුප්‍රාප්තිකයකු රහිතව/ අනුප්‍රාප්තිකයකු පසුව ලබා දීමේ පදනම මත ස්ථාන මාරුවීම් ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය.භාෂා පරිවර්තක නිලධාරියකු,තොරතුරු සන්නිවේදන නිලධාරියකු හා තාක්ෂණ නිලධාරී හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 03 ක් සඳහා පුරප්පාඩු තනතුරු ඇතිවූ දා සිට පවතින බව විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව නිරීක්ෂණය විය. | දමිළ මාධ්‍ය සංවර්ධන නිලධාරීන් සහ කළමණාකරන සේවා නිලධාරීන් හෝ අනුයුක්ත කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත.පුරප්පාඩුව පවතින ශ්‍රී ලං.ප.සේ. I/II/III ශ්‍රේණියේ තනතුරු සහ ශ්‍රී ලං.ග.සේ II/III ශ්‍රේණියේ තනතුරු සම්පූර්ණ කර දෙන ලෙස 2024 වර්ෂයේ දිගින් දිගටම රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත. තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ නිලධාරී තනතුරක් සහ තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර නිලධාරී තනතුරු 05 ක් සඳහා පුරප්පාඩු තනතුරු ඇති වූ දා සිට පවති. එකී පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති | අවශ්‍යතාවය අනුව පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුය. |

අතර එයින් පුරප්පාඩු 02 ක් සම්පූර්ණ කර ගැනීමට හැකි විය. පුරප්පාඩු පිරවීම සඳහා විවිධ අවස්ථාවන්හිදී අනුමැතිය ලබාගත යුතු ආයතන වෙත ඉල්ලීම් කර අනුමැතිය ලබාගැනීම සඳහා ඉල්ලුම් කළද අදාළ අනුමැතිය ලබාදී නොතිබීම නිසා පුරප්පාඩු වූ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි විය.

(ඇ) වර්තමානය වන විට රජයේ ඉඩම් විවිධ හේතුමත අයිතිය බැහැරවීම් ඉහළ යාමක් දක්නට ලැබෙන බැවින් දෙපාර්තමේන්තුවේ පවතින කාර්යයන් පිළිබඳ සමාලෝචනයක් සිදුකර ඒ අනුව දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ නැවත සංශෝධනයක් සිදුකර එම අනුමැතිය පදනම් කරගනිමින් කාර්ය මණ්ඩලය සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.